ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 22/05/18

පැමිණිලිකරු : ජී.ජී.සී. රාජපක්ෂ මයා,
අංක 34/18, ඔරුවෙලයාය,
මොරයාය, මිණිපේ.

වගඋත්තරකරුවන් : ආර්.එම්.ඒ. රත්නායක මයා,
විදුහල්පති,
මප/තෙල්/සංඝබෝධි ම.ම.වි,
මොරයාය, මිණිපේ.

<u>පැමිණිලි අංක : HRC/K/152/16-A</u>

**පැමිණිලිකරුගේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලි පාර්ශවය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තම දරුවා වන දහම් රසාංජන රාජරත්න යන අය මප/තෙල්/සංඝබෝධි මධ්‍ය විද්‍යාපයේ 8 වන වසරෙහි ඉගෙනුම ලබමින් සිටි බවත්, 2016.02.16 වන දින කමිසයේ පිටුපස කොටස ඉහලට ඇදී ඇති බව පවසා විදුහල්පතිවරයා විසින් ඔහුට පහර දී ඇති බවත්, අදාළ පහරදීම හේතුවෙන් දරුවාගේ කණට හානි වී ඇති බවත්ය. ඒ අනුව එදින රාත්‍රී 7.00 ට පමණ තම දරුවා කණ රිදෙන බව පවසා ඇඩීමට පටන් ගත් බවත්, එම අවස්ථාවේදී රෝහලයට යාමට නොහැකි බැවින් පසු දින මොරයාය රජයේ රෝහලට ඇතුළත් කිරීමෙන් පසු වෛද්‍යවරයා විසින් දරුවා පරීක්ෂා කර බලා දරුවාගේ කණ් අඩිය පැලී ඇති බව ප්‍රකාශ කර දරුවා මහියංගනය රෝහලට ඇතුළත් කරන ලෙස දැනුම් දීම මත දරුවා මහියංගනය රෝහලට ඇතුළත් කරන ලද බවත් සඳහන් කර ඇත. ඉන් පසු මේ සම්බන්ධයෙන් හසලක පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කළ බවත් මෙම පහර දීමෙන් දරුවාගේ කණ ඇසීම අඩු වී ඇති බවත් දරුවා දිගටම සායනය සඳහා යොමු කරන ලෙස වෛද්‍යවරුන් විසින් දන්වා ඇති බවත් සඳහන් කර ඇත. එසේම මෙම පහරදීම හේතුවෙන් දරුවා එම පාසලට යාම ප්‍රතික්ෂේප කරන බැවින් දරුවාට වෙනත් පාසලක් සොයා ගැනීමට අවශ්‍ය බවත් මේ පිළිබඳ කොමිෂන් සභාවේ අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිට ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැලකිරීම :-**

පැමිණිල්ල සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් වගඋත්තරකාර විදුහල්පතිවරයා විසින් දන්වා ඇත්තේ, සිද්ධිය සිදු වූ දින තමන් පාසලේ පන්ති නිරීක්ෂණයට යාමේදී



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.con
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

මෙම සිද්ධියට සම්බන්ධ සිසුවා තවත් සිසුවකු සමඟ පන්ති කාමරයෙන් බැහැරව පාසල් මිදුලේ කලහකාරී ලෙස හැසිරෙමින් සිටි බවත්, එහිදි සිසුවා කමිසය උඩින් දමාගෙන පාසලට දැමීමට අවසරයක් නොමැති පාවහන් යුගලක් පැලඳගෙන සිටි බවත්, ඉන් පසු මෙම සිසුවා කැඳවා පන්ති කාමරයෙන් බැහැරව සිටීම හා කලහකාරී ලෙස හැසිරීම පිළිබඳ විමසා ඔහුට වැරැද්ද අවබෝධ කර දී පන්ති කාමරයට යන ලෙස අවවාද කර සුළු දඬුවමක් ලබා දුන් බවත් සඳහන් කර ඇත. එසේම දරුවාගේ මව විසින් මේ සම්බන්ධයෙන් හසලක පොලිසියට කරන ලද පැමිණිල්ල අනුව තමන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ඇප මත මුදා හරින ලද බවත්, දරුවා නැවත පාසලට ගෙන්වා ගැනීමට උත්සහ කළද එය අසාර්ථක වූ බවත්, දරුවාගේ මව විසින් දරුවාගේ අස්වීම් සහතිකය ඉල්ලා ඇති බැවින් එය නිකුත් කර ඇති බවත්, මෙහිදී දරුවා කෙරෙහි අනුකම්පාවෙන් දයාවෙන් මෙතෙක් කටයුතු කර ඇති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

**විමර්ශන හා පරීක්ෂණ කටයුතු වලදී අනාවරණය වූ කරුණු :-**

අදාළ ශිෂ්‍යයාට පහරදීම හේතුවෙන් මහියංගනය මූලික රෝහලෙන් නේවාසිකව ප්‍රතිකාර ලබාගෙන ඇති අතර, වැඩිදුර ප්‍රතිකාර සඳහා මානසික වෛද්‍ය සායන සඳහා ද යොමු කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව අධිකරණ වෛද්‍යවරයා විසින් ඉදිරිපත් කර ඇති අධිකරණ වෛද්‍ය වාර්තාවේ වෛද්‍යවරයාගේ මතය වී ඇත්තේ රෝගියා විසින් දුන් රෝගී ඉතිහාසය වූ කණට පහරදීමේ ආකාරය හා තුවාල සිදුවීම සැසඳෙන බවය. එහිදි අදාල වෛද්‍යවරයා වරයා තවදුරටත් දක්වනුයේ වම් කණෙහි ඇසීම අඩු වී ඇති බවත් එය මාස කිහිපයකින් යථා තත්ත්වයට පත් විය හැකි බවත්ය. එමඟින් වගඋත්තර පාර්ශවය විසින් මෙම දරුවාට පහර දී ඇති බව පැහැදිලි වේ.

තවද වෛද්‍ය වාර්ථාවේ සඳහන් වන පරිදි මෙම පහරදීම නිසා මෙම දරුවා අනිසි ලෙස බියට පත් වී ඇති අතර, රාත්‍රී කාලයේදී නින්දෙන් බියට ලක් වන බව තහවුරු කර ඇත. එය Anxiety Symptom ලෙස හඳුන්වා ඇති අතර, එමඟින් මෙම පහරදීම හේතුවෙන් දරුවාගේ මානසික තත්ත්වය බිඳ වැටී ඇති බවද තහවුරු වේ.

වගඋත්තරකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලි විභාගයේදී තමන් විසින් අදාළ දරුවාට සිදු කරන ලද වරද සම්බන්ධයෙන් අවවාද කර සුළු පහර දීමක් සිදු කළ බවත්, එම අවස්ථාවේදී දරුවා හැරුණු බැවින් වම් කණට එය වැදුනු බවත් ප්‍රකාශ කිරීම මඟින් අදාළ පහර දීම සිදුකර ඇති බව වගඋත්තරකරු විසින්ම පිළිගෙන ඇති බවට කරුණු තහවුරු වේ.

අදාළ පහරදීම සම්බන්ධයෙන් දරුවාගේ මව විසින් හසලක පොලිසියට කරන ලද පැමිණිල්ල අනුව පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර නඩු පැවරීමක් සිදුකර ඇති බව තහවුරු වේ. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 12/2016 චක්‍රලේඛනයේ පැහැදිලිව දක්වා ඇත්තේ, පාසලට පැමිණෙන සිසුන්ගේ ආරක්ෂාව සැළසීමත් ඔවුනට සිදුවන හිංසනයන් වැළැක්වීම සඳහාත් විදුහල්පතිවරුන් ගුරුවරුන් හා සෙසු කාර්ය මණ්ඩල සමාජිකයන් එම චක්‍රලේඛනයේ උපදෙස් පිළිපැදිය යුතු බවයි. එමඟින් ශාරීරිකව සිදුකරන දඬුවම් නොකළ යුතු බවට පැහැදිලිව දක්වා ඇත.

**නිගමනය :-**

වගඋත්තරකාර විදුහල්පති විසින් දහම් රසාංජන රාජරත්න දරුවාට පහරදීම මඟින් ඔහුට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාවෙන් සහතික කර දී ඇති කෲර අමානුෂික වදහිංසාවකට හෝ අවමන් සහගත සැලකිල්ලකට භාජනය නොවීමට ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

මෙම වගඋත්තරකාර විදුහල්පති, ආර්.එම්.ඒ රත්නායක මහතා සම්බන්ධයෙන් විනය පියවර ගැනීම සඳහා කටයුතු කළ යුතු බවට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිර්දේශ කරනු ලැබේ.

2022. 07. 30 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

Justice Rohini Marasinghe
Judge of the Supreme Court (Retired)
Chairperson
Human Rights Commission of Sri Lanka

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ.නිමල්කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත :-

1. අමාත්‍යතුමා
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල. - ඉහත නිර්දේශය පරිදි කටයුතු කිරීමට

B/R